


# 'ඇමරිකාවට මරණය 9/11 - 2

ශ්‍රීලාල් සෙනෙවිරත්න

සැප්තැම්බර් මාසය ඇමරිකාවේ මෑත ඉතිහාසයට එක්කරනු ලැබ ඇත්තේ බලවත් කළු පැල්ලමකි. ඒ මෙයින් වසර එකොළහකට පෙර සැප්තැම්බර් 11වෙනිදා අල්-ක්වයිදා සංවිධානය ඇමරිකාවේ ලෝක වෙළඳ මධ්‍යස්ථානයට එල්ල කළ බිහිසුණු ත්‍රස්තවාදී ප්‍රහාරය හේතුවෙනි. මුළු ලෝකයම විශ්මයෙන් බලා සිටියදී ගුවනින් එල්ල කළ මේ ප්‍රහාරයෙන් ඉතා සුළුවේලාවක් තුළ ඇමරිකා ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ සිටි 5000ක පමණ පිරිසක් මරාදමන්නට අල්-ක්වයිදාව සමත්විය. එදා සිට සෑම වසරකම සැප්තැම්බර් 11 ඇමරිකාව මේ 'මළවුන්ගේ දිනය' සමරනු ලැබුයේ මහත් වේදනාවෙන් හැඟීම්බරවය. ඒ සමරන වාරයක් පාසා ඇමරිකානුවන් අල්-ක්වයිදාවේ අවසානය පාර්ථනා කරමින් එයට ආධාර අනුබල දෙන මුස්ලිම් රටවලට ශාප කළා නිසැකය. සාමය අගයන ලෝක ප්‍රජාවද මේ කාරණයේදී ඇමරිකාව සමඟ එකම වේදිකාවට ගොඩවිය. 'ඇමරිකාවට මරණය' ගෙන ආ අල්-ක්වයිදාව ලුහුබැඳ යමින් එහි නායක ඔසාමා බින් ලාඩන් මරාදමන්නට පවා පසුව ඇමරිකාව සමත්වූයේ ඒ සවියෙනි. ඉන් නොනැවතී ඇමරිකාව අරාබි ලෝකයේ විවිධ රටවලට විවිධ ප්‍රවේශ මාර්ග ඔස්සේ ගොඩවැදුණේ අනාගත අභියෝගයකට මුහුණ දීමේ උපාය මාර්ගික සැළැස්මක් ක්‍රියාවට නඟමිනි. අරාබි රටවල් ඇමරිකාවට එරෙහිව එක කඳවුරකට එක්වීම වැළැක්වීම මගින් ඉස්ලාම් මූලධර්මවාදීන් අඩපන කොට මරණයෙන් ('ඇමරිකාවට මරණය') බේරීම එහි අංගයක් විය. එම වැඩපිළිවෙළ යම් සාර්ථකත්වයක් නොලැබුවේද නොවේ.

එහෙත් වසර 11කට පසු නැවතත් 'ඇමරිකාවට මරණය' සටන් පාඨය ඉකුත් සැප්තැම්බර් 11වෙනිදා නව ජීවයක් ලැබූයේ අරාබි රටවල් එක් කඳවුරකට ගොණුකරමිනි. මෙවර ඇමරිකාවේ එකොළොස්වසරක ප්‍රගතිය විනාඩි 13ක් තුළ ආපසු හරවනු ලැබුවේ ඇමරිකානුවෙකු විසින්මය.

'නකුලා බැසලේ නකුලා' ඒ ඇමරිකානුවාය. දැන් මේ නම ඔසාමා බින් ලාඩන් යන නම තරමටම ලෝකයේ ප්‍රසිද්ධය. ඇමරිකාවට එදා ඔසාමා යම් සේ වීද මුස්ලිම් ලෝකයට අද 'නකුලා'ද එසේමය. නකුලා ඇමරිකාවේ ලොස් ඇන්ජලීස් නුවර පදිංචි 55 වියැති දේපොළ වෙළඳාම්කරුවකි. ඔහු චිත්‍රපටි අධ්‍යක්ෂණයට පිවිසෙමින් නිර්මාණය කළ 'ඉනසන්ස් ඔෆ් ද මුස්ලිම්ස්' චිත්‍රපටය මෙතෙක් තිරගතවී නැත. එහෙත් එහි පූර්ව ප්‍රචාරක දර්ශණ අන්තර් ජාලයේ ශධඹ ඔඹඊෑ වෙබ් අඩවියට එක්කරනු ලැබ තිබේ. ඒ දර්ශන අන්තර් ජාලයට එක්කර ඇත්තේ පසුගිය ජූලි මාසයේදීය. එහෙත් ඒ ගැන මුස්ලිම් ලෝකයේ අවධානය යොමුවන්නේ සැප්තැම්බර් මාසයේදීය. ඒ අරාබි බසින් හඬ කවන ලද පූර්ව ප්‍රචාරක දර්ශණ අන්තර් ජාලයට එක්කිරීමත් සමඟය.

අන්තර් ජාලයෙන් බාගත් එම දසුන් ඊජිප්තුවේ 'අල්-තාජ්' රූපවාහිනී නාලිකාවෙන් මුල්වරට විකාශය කෙරුණේ සැප්තැම්බර් මස 8වෙනිදාය. එම නාලිකාව 'ඉනසන්ස් ඔෆ් මුස්ලිම්ස්' චිත්‍රපටිය හඳුන්වා දුන්නේ නබි නායකතුමාට අපහාස වන චිත්‍රපටියක් ලෙසටය. ඉන් පසු ඊජිප්තුව ගිනි ගන්නට වැඩි වෙලාවක් ගතවූයේ නැත. ඇමරිකාව 9/11 ප්‍රහාරයේ මළවුන්ගේ දිනය සමරද්දී ඊජිප්තුවෙන් ඇරඹි 'ඇමරිකාවට මරණය' විරෝධතා සෙසු මුස්ලිම් රටවලටද පැතිර ගියේය.

අරාබි රටවල ඇමරිකා තානාපති කාර්යාල වටකොට දහස් ගණනින් රොද බැඳ පැවැත්වූ විරෝධතා ව්‍යාපාර සාමකාමී ඒවා නොවීය. ප්‍රචණ්ඩ ඒවා විය.

ඇමරිකා තානාපති කාර්යාලවලට ප්‍රහාර එල්ල වන්නට පටන්ගත්තේය. මෙය ලියන අවස්ථාව වන විට මේ ප්‍රචණ්ඩ ක්‍රියාවලින් ජීවිතක්ෂයට පත්වූ සංඛ්‍යාව 100 ඉක්මවා ගොසිනි. නකුලේගේ චිත්‍රපටිය මුල් කරගනිමින් ඇමරිකාවට එරෙහිව මුස්ලිම් ලෝකය එක් කඳවුරකට රොක්වෙමින් සිටියි. එය ඇමරිකාවට කොතරම් තදින් දැනී ඇතිද යත් ජනපති ඔබාමා සහ රාජ්‍ය ලේකම් හිලරි ක්ලින්ටන් නකුලේගේ ක්‍රියාව හෙළාදකිමින් නිවේදන නිකුත් කිරීමට තරම් නිහතමානි විය. එහෙත් ඉස්ලාම් ප්‍රජාව ඒ පිළිබඳ තැකීමක් කළ බවක් පෙනෙන්නට නොමැත.

පාකිස්ථානයේ දුම්රිය කටයුතු ඇමැති ගුලාම් අහමඩ් ප්‍රසිද්ධියේ කියා සිටියේ නකුලේ මරාදමන්නෙකුට ඩොලර් ලක්ෂයක ත්‍යාගයක් දෙන්නට තමන් සූදානම් බවය. මේ වන විට නකුලේට ජීවිත තර්ජණ එල්ලවී ඇත්තේ පිටස්තර රටවලින් පමණක් නොවේ. තමන් වෙසෙන ඇමරිකාවෙන් ද තර්ජණ එල්ලවී තිබේ. එබැවින් නකුලේ ආරක්ෂා කරගන්නට ඇමරිකා රජයට වෙහෙසක් දරන්නට සිදුව තිබේ. දැන් නකුලේ සිය පවුලේ සාමාජිකයන් සමඟ ජීවත්වන්නේ ඇමරිකා ආරක්ෂක අංශ රැකවරණය යටතේ රහස් තැනකය. එමගින් නකුලේගේ ජීවිතය ආරක්ෂා කරගන්නට ඇමරිකාවට හැකියාව ලැබී තිබේ. එහෙත් මේ අයුරින්ම ලොව පුර සිටින ඇමරිකානුවන්ගේ ආරක්ෂාව සැලසීමේ හැකියාවක් ඇමරිකාවට තිබේද?

## දිනපොත

## 2012 සැප්තැම්බර්

08. කැනඩාව ඉරානය සමඟ පැවැති සියළු රාජ්‍ය තාන්ත්‍රික සබඳතා අත්හිටුවා තානාපති කාර්යාලයද වසා දමයි. ඉරනයෙ න්‍යෂ්ඨික වැඩපිළිවෙළ ගෝලීය ආරක්ෂාවට තර්ජණයක් බැවින් ඊට විරෝධය පළකිරිමක් ලෙස මේ පියවර ගත් බව කැනඩාව පවසයි.

10. අල්-ක්වයිදා සංවිධානයේ දෙවන නායකයා මෙන්ම මැදපෙරදිග මෙහෙයුම් භාර ප්‍රධානියාද වූ ෂයිඩ් අල් ෂේරි යේමන හමුදා ප්‍රහාරයකින් ජීවිතක්ෂයට පත්වේ.

11. ඇමරිකාව 9/11 ප්‍රහාරයේ 11වන සංවත්සරය සමරද්දී ඇමරිකන් ජාතිකයෙකු විසින් නිපදවන ලද චිත්‍රපටියකින් ඉස්ලාම් ආගමට අපහාසයක් සිදුවී යැයි කියමින් මුස්ලිම් රටවල් ගණනාවක ජනතාව ඇමරිකාවට එරෙහිව විරෝධතා පෙළපාලි ඇරඹේ.

12. ලිබියාවේ බෙන්ගාසි නගරයේ පිහිටි ඇමරිකා තානාපති කාර්යාලයට එල්ල කෙරුණු ත්‍රස්තවාදී ප්‍රහාරයකින් ලිබියාවේ ඇමරිකා තානාපති ක්‍රිස් ස්ටීවන් සහ තානාපති කාර්යල නිලධාරින් තිදෙනෙකු ජීවිතක්ෂයට පත්වෙති.

18. පාකිස්ථාන ජනපති අසීස් අල් සර්දාරිට එරෙහි දූෂණ චෝදනා නඩු විභාගය යළි අරඹන ලෙස ස්විස-"ටර්ලන්ත බලධාරින්ට දැනුම්දීමට කටයුතු සූදානම් කරමින් පවතින බව අගමැති පර්වේස් අෂ්රාෆ් ශ්‍රේෂ්ඨාධිකරණය දැනුම්දෙයි.

25. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසිවාරය ඇමරිකාවි නිව්යෝර්ක් නගරයේදී ඇරඹේ. සිරියා අර්බුදය සහ ඉරාන න්‍යෂ්ඨික වැඩපිළිවෙළ මෙම සැසියේ විශේෂ අවධානයට ලක්කිරීමට නියමිතය.

26. සිරියා හමුදා සහ රජයට විරුද්ධ කැරලිකරුවන් අතර ඇතිවූ දරුණු ගැටුම්වලින් අඩුතරමින් 305දෙනෙකුවත් මියගොස් එරටින් ලැබෙන මානව හිමිකම් වාර්තා පවසයි. ඉන් 200දෙනෙකු පමණ සිවිල් වැසියන් බවද වාර්තාවේ.

නැවුම් පුවත් හරවත් කතා බහ
දෙස් විදෙස් සාලීන සිද්ධීන් මියුරු සංගීතය
සිංහලෙන් පැය දෙකක්
FM 97
සෑම ඉරිදාවකම
දහවල් 10.00 සිට 12.00 දක්වා

රංජිත් රූබි සමග පැය තුනක් විනෝදය සහ නැවුම් ගීත සමගින්
සෑම ඉරිදාවකම රාත්‍රී 8 ට හමුවෙමු
Voice of Lanka
97.7FM 3SER

ලක් මිහිර
සිංහල ගුවන් විදුලිය
සෑම බ්‍රහස්පතින්දාම සවස 6 සිට 8 දක්වා
FM 88.6

FM 94.1
ලක් මිහිර South
අඟහරුවාදා රාත්‍රී
10 - 12 දක්වා
අසන්න - විඳින්න